# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1987/6 - 2016 ඔක්තෝබර් 03 වන සඳුදා - 2016.10.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම.

*මගේ අංකය* : AKU/LAN/06/LA64.
*ඉඩම් ආමාත්‍යාංශයේ අංකය* : 4/3/3/2013/එච් ඩබ්/365.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම / පරවශ්‍යතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තර :*

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වැලිගම් කෝරළේ (උතුර) සුළු කොට්ඨාසයේ කැටන්විල ගමේ පිහිටි මාතර සර්වේ ජනරාල්ගේ අ.ග.පි. 534 අතිරේක අංක 15 හා පත්‍ර අංක 16 දරන අවසාන ගම් පිඹුරේ පෙන්නුම් කරන පහත දැක්වෙන ඉඩම් කොටස්:

01. **කැබලි අංක 331 - ඉඩමේ නම: පොල්කොරටුව, කලුගහඹිවිටේවත්ත; වර්ග ප්‍රමාණය: හෙක්ටයාර් 0.0036.**

*උතුරට*: කැබලි අංක 11; *නැගෙනහිරට*: කැබලි අංක 11; *දකුණට*: කැබලි අංක 11 සහ 334; *බටහිරට*: කැබලි අංක 334 සහ 11.

02. **කැබලි අංක 332 - ඉඩමේ නම: පොල්කොරටුව, කලුගහඹිවිටේවත්ත; වර්ග ප්‍රමාණය: හෙක්ටයාර් 0.0008.**

*උතුරට*: කැබලි අංක 11; *නැගෙනහිරට*: කැබලි අංක 11; *දකුණට*: කැබලි අංක 11 සහ 333; *බටහිරට*: කැබලි අංක 11.

03. **කැබලි අංක 333 - ඉඩමේ නම: පොල්කොරටුව, කලුගහඹිවිටේවත්ත; වර්ග ප්‍රමාණය: හෙක්ටයාර් 0.0022.**

*උතුරට*: කැබලි අංක 11 සහ 332; *නැගෙනහිරට*: කැබලි අංක 11; *දකුණට*: කැබලි අංක 11 සහ 335; *බටහිරට*: කැබලි අංක 11.

04. **කැබලි අංක 334 - ඉඩමේ නම: කරුණාව කන්දඹිවිට, මුලනෙඹිවිට, දළුගොඩගෙඹිවිට, පිනිනගොඩගෙඹිවිට, පොල්කොරටුව සහ කලුගහඹිවිටේවත්ත; වර්ග ප්‍රමාණය: හෙක්ටයාර් 0.0037.**

*උතුරට*: කැබලි අංක 12, 11 සහ 331; *නැගෙනහිරට*: කැබලි අංක 331, 11 සහ 12; *දකුණට*: කැබලි අංක 11 සහ 12; *බටහිරට*: කැබලි අංක 12 සහ 11.

05. **කැබලි අංක 335 - ඉඩමේ නම: කරුණාව කන්දඹිවිට, මුලනෙඹිවිට, දළුගොඩගෙඹිවිට, පිනිනගොඩගෙඹිවිට, පොල්කොරටුව සහ කලුගහඹිවිටේවත්ත; වර්ග ප්‍රමාණය: හෙක්ටයාර් 0.0052.**

*උතුරට*: කැබලි අංක 12, 11 සහ 33; *නැගෙනහිරට*: කැබලි අංක 11 සහ 12; *දකුණට*: කැබලි අංක 12; *බටහිරට*: කැබලි අංක 11 සහ 12.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1A - G 24301– 32 - (2016/10)

ඉහත සඳහන් ඉඩමට/ පරවශ්‍යතාවට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවළුන් පහත සඳහන් දිනයන්හිදී අකුරුස්ස ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

| *දිනය* | *වේලාව* | *කැබලි අංකය* |
|---|---|---|
| 2016.12.07 | ප. ව.1.30 | 331, 332, 333, 334, 335 |

තව ද, 2016 නොවැම්බර් මස 25 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශ්‍යතාවය ලබා ගැනීම ගැන වන්දි මුදල් ඉල්ලා සිටීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා එය ගණනය කළ ආකාරයත් පිටපත් දෙකක් සහිත ලියවිල්ලකින් දැනුම් දිය යුතුය. අයිතිවාසිකම් තහවුරු කිරීමට ඇති සියලු ඔප්පු තිරප්පු හා වෙනත් ලියවිලි විභාගයට ඉදිරිපත් කළ යුතු ය.

ඕ. වී. චන්දන තිලකරත්න,
ප්‍රාදේශීය ලේකම්,
අකුරුස්ස.

2016 සැප්තැම්බර් මස 29 වැනි දින,
අකුරුස්ස ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

10-461

ශුද්ධි පත්‍රය

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි.

*ප්‍රාදේශීය ලේකම් යොමු අංකය* : 6/3/7/15/7/3.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය* : LD/05/2007/MV/118C.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තිය යටතේ 1979/44 හා 2016.08.12 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළ කරන ලද හිමිකම් පරීක්ෂණය පැවැත්වෙන දිනය 2016.08.25 පෙ.ව. 9.00 වශයෙන් සඳහන් වුවද එය 2016.10.24 වැනි දින පෙ.ව. 9.00 යනුවෙන් සංශෝධනය විය යුතු බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩී. ආර්. බී. එන්.බී. කරුණාතිලක,
ප්‍රාදේශීය ලේකම්,
නාඋල.

2016 සැප්තැම්බර් මස 29 වැනි දින,
නාඋල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

10 - 462

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.